*සැ. යු.* - 2023.04.12 දින පළ වූ අංක 2328 දරන *ගැසට් පත්‍රයේ* I/II (අ), II සහ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,329 - 2023 අප්‍රේල් මස 21 වැනි සිකුරාදා - 2023.04.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 132 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 132 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 මැයි මස 12 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 අප්‍රේල් මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

වයඹ පළාත් සභාවේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඩබ්ලිව්. තිළිණි නිසංසලා සිල්වා වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ආණ්ඩුකාරවරයා විසින් 1960 වසරේ දී ප්‍රදානය කර ඇති අංක ආර් 6179 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන මහා නාගවත්ත, මොරගහවැව, විතිකුලිය හි පදිංචි අර්නස්ට් ක්‍රිස්ටෝපර් පෙරේරා වෙත ප්‍රදානය කොට කුරුණෑගල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 2/44 යටතේ 1960.07.05 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩම, දීමනා පත්‍රයේ කොන්දේසි උල්ලංඝනය වන පරිදි අන්සතු කර ඇති බැවින්, එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය **2023.06.02** දිනට පෙර මා වෙත ලිඛිතව දනුම් දිය යුතු ය.

### උපලේඛනය

කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ, කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දේවමැදි හත් පත්තුවේ, බලදොර කෝරළේ 1303 - විතිකුලිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අ. ග. පි. 1570 - මොරගහවැව නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 1570 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 50,55,57 දරන බිම් කැබලි වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්කර 24 රූඩ් 02 පර්චස් 32ක් පමණ විශාලත්වයක් ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : මොරගහවැවමූකලාන.

| | | |
|---|---|---|
| *උතුරට* | : | අ. ග. පි. 1570 හි කැබලි අංක 24, 92, 63, 62, 61 හා 58 |
| *නැගෙනහිරට* | : | අ. ග. පි. 1570 හි කැබලි අංක 63, 62, 61, 56 හා මැදගම් දහය කෝරලය |
| *දකුණට* | : | මැදගම් දහය කෝරලය, අ.ග.පි. 1570 හි කැබලි අංක 28 (මාර්ග රක්ෂිතය) 54, 51, 26 හා 52, |
| *බස්නාහිරට* | : | අ. ග. පි. 1570 හි කැබලි අංක 28 (මාර්ග රක්ෂිතය) 54, 27, 26 , 51, 52 හා 24. |

ඩබ්ලිව්. තිළිණි නිසංසලා සිල්වා,
ප්‍රාදේශීය ලේකම්,
කොබෙයිගනේ.

2023 මාර්තු මස 02 වැනි දින

04-200

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/52513
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : පළාත්/ඉකො/ඉ9/මකු/දී. බ. 04.

21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

පුත්තලම දිස්ත්‍රික්කයේ, මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසට අයත් 613, කවයංකුලම ග්‍රාම නිලධාරි වසමේ, සෙම්බුකුලිය ගමේ පිහිටි ජනපද නිලධාරි විසින් අඳින දළ අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 28ක් වූ රජයේ ඉඩම් කොටස කෘෂිකාර්මික වාණිජ කටයුතු සඳහා හිටිහාමි මුදියන්සේලාගේ ධනුෂ්ක සෙනරත් මහතා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාර්ග රක්ෂිතය හා රජයේ ඉඩම, |
| *නැගෙනහිරට* | : | රජයේ ඉඩම, |
| *දකුණට* | : | රජයේ ඉඩම, |
| *බටහිරට* | : | මාර්ග රක්ෂිතය හා රජයේ ඉඩම. |

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ ：

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2022.06.09 දින සිට ඉදිරියට වසර තිහක්),

(ආ) *වාර්ෂික බදු මුදල.*- 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2%කි. 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල.* - වාර මුදලක් අය නොකෙරේ,

(ඇ) මෙම ඉඩම කෘෂිකාර්මික වාණිජ කටයුත්තක් සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය,

(ඈ) මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය,

(ඉ) පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්, ව්‍යාපෘතියට අදාළ ආයතන හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය,

(ඊ) සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය,

(උ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ,

(ඌ) 2022.06.09 දින සිට වසර 05ක් ගතවන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ,

(එ) බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත,

(ඒ) බදු ගෙවීම් අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවක දී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩබ්. ආර්. ඒ. ටී. ශකුන්තලා විජේසුන්දර,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2023 මාර්තු මස 28 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

04-202

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය ： 4/10/56732.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය ： පළාත්/ඉකො/ඉ9/මකු/දී. බ. 05.

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

පුත්තලම දිස්ත්‍රික්කයේ, මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 613, කවයංකුලම ග්‍රාම නිලධාරි වසමේ, සෙම්බුකුලිය ගමේ පිහිටි රජයේ ඉඩම සඳහා ජනපද නිලධාරි විසින් අඳින ලද දළ අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 18ක් පමණ විශාල වූ රජයේ ඉඩම් කොටස කෘෂිකාර්මික වාණිජ කටයුතු සඳහා හිටිහාමි මුදියන්සේලාගේ ඥානරත්න මහතා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ ：

*උතුරට* ： මාර්ග රක්ෂිතය හා රජයේ ඉඩම,
*නැගෙනහිරට* ： රජයේ ඉඩම,
*දකුණට* ： රජයේ ඉඩම,
*බටහිරට* ： මාර්ග රක්ෂිතය හා රජයේ ඉඩම.

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ ：

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2022.06.30 දින සිට ඉදිරියට වසර තිහක්),

*(ආ)* *වාර්ෂික බදු මුදල*.- 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2%කි. 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල*. - වාර මුදලක් අය නොකෙරේ,

*(ඇ)* මෙම ඉඩම කෘෂිකාර්මික වාණිජ කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය,

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය,

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම්, ව්‍යාපෘතියට අදාළ ආයතන හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය,

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය,

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ,

*(ඌ)* 2022.06.30 දින සිට වසර 05ක් ගතවන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ,

*(එ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත,

*(ඒ)* බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවක දී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

මෙහි පහත සඳහන් දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩබ්. ආර්. ඒ. ටී. ශකුන්තලා විජේසුන්දර,  
සහකාර ඉඩම් කොමසාරිස්,  
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2023 මාර්තු මස 28 වැනි දින,  
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ අංක 1200/6 හි,  
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

04-201

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/67854.  
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : එන්සීපී/පීඑල්සී/එල්02/ මනුප/දීකාබ.

21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 313 මාන්කඩවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මාන්කඩවල ගමේ අංක ඉඩම් නිලධාරි විසින් සකසන ලද දළ අනුරේඛනයේ දැක්වෙන ප්‍රමාණයෙන් අක්කර 02ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් කෘෂිකාර්මික කටයුතු සඳහා මෝහන් සුනේන්ද්‍ර බුද්ධික හැගොඩ ආරච්චි මයා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙ හි මායිම් මෙහි පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | එස්. කරවිටගේ ඉඩම, |
| *නැගෙනහිරට* | : | අඩුකැටියාව මාර්ග රක්ෂිතය, |
| *දකුණට* | : | ඩී. ඒ. කරවිටගේ ඉඩම, |
| *බටහිරට* | : | ඕ. එන්. කරවිටගේ ඉඩම. |

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2022.11.02 දින සිට ඉදිරියට)

(ආ) *වාර්ෂික බදු මුදල.*- 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2022 වර්ෂයෙ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2%කි. 2022 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර එයට කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල.* - වාර මුදලක් අය නොකෙරේ,

(ඇ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණ දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය,

(ඈ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය,

(ඉ) ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය,

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ,

(උ) 2022.11.02 දින සිට වසර 05ක් ගතවන තුරු මෙම ඉඩම අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. ඉන්පසු වුවද, අතුරු බදු දීම් හෝ පැවරීම් කළ හැක්කේ මෙම ඉඩම බදුගත් කාරණය සඳහා පමණි,

(ඌ) බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*ගැසට් නිවේදනය* පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩී. ඩී. නවෝද්‍යා සී. කරුණාරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2023 අප්‍රේල් මස 06 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, ''මිහිකත මැදුර'',
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

04-241

---

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/70430.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : එන්සීපී/පීඑල්සී/එල්02/ මනුප/4/1.

### 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම්පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 316 තෙප්පන්කුලම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තෙප්පන්කුලම ගමේ අ. ග. සි. 171 පිඹුරේ 125න් කොටසක් දැක්වීමට අදින ලද දළ අනුරේඛනයේ කැබලි අංක 02 දරන ප්‍රමාණයෙන් අක්කර 03, රූඩ් 01, පර්. 10ක් කෘෂිකාර්මික කටයුතු සඳහා හර්ෂජීව ධර්මප්‍රිය නයන උජිත් ප්‍රනාන්දු මහතා නමින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | නිමල්ගේ ඉඩම, එස්. දයාරත්නගේ ඉඩම, මාර්ග රක්ෂිතය හා එච්. ඩී. එන්. යූ. ප්‍රනාන්දුගේ ඉඩම, |
| *නැගෙනහිරට* | : | නිමල්ගේ ඉඩම හා දසනායකගේ ඉඩම, |
| *දකුණට* | : | එච්. ඒ. සුනිල්ගේ ඉඩම හා දසනායකගේ ඉඩම, |
| *බටහිරට* | : | එස්. දයාරත්නගේ ඉඩම, මාර්ග රක්ෂිතය, එච්. ඩී. එන්. යූ. ප්‍රනාන්දුගේ ඉඩම හා එච්. ඒ. සුනිල්ගේ ඉඩම. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි. (30) (2023.01.17 දින සිට 2053.01.16 දක්වා)

*වාර්ෂික බදු මුදල*.- 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2%කි. 2023 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000.00) වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර එයට කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතු විය යුතු ය.

*වාර මුදල*. - වාර මුදලක් අය නොකෙරේ,

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණ දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය,

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය,

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය,

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණු සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක, බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ,

*(උ)* 2023.01.17 දින සිට වසර 05ක් ගතවන තුරු අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

*ගැසට් නිවේදනය* පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ඩී. ඩී. නවෝද්‍යා සී. කරුණාරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2023 අප්‍රේල් මස 11 වැනි දින,
අංක 1200/6 හි, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර, බත්තරමුල්ල,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

04-242

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.